# ''කඩවුණු පොරොන්දුව'' චිත්‍රපටයෙන් නිරූපිත සමාජ සංලක්ෂණය.

රවීන්ද්‍ර ප්‍රියන්ත ලාල්
ravipriyanlal@gmail.com
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

1947 දී තිරගත වූ කඩවුණු පොරොන්දුව චිත්‍රපටය ප්‍රථම සිංහල කථානාද චිත්‍රපටය වේ. එය සමකාලීන සමාජ අත්දැකීමක් පදනම් කරගත් වෘත්තාන්ත චිත්‍රපටයක් වන අතර, එය, එනමින් ම නිෂ්පාදිත බී.ඒ. ඩබ්. ජයමාන්නගේ මිනර්වා නාට්‍යය චිත්‍රපටයට නැගීමකි. චිත්‍රපටය තිරගත වූවායින් පසුව ඉදිරිපත් වී ඇති විචාරවලින් එකී චිත්‍රපටයේ නිරූපිත දේශීයත්වය සහ සමාජ පැතිකඩ පිළිබඳ නිර්දය විවේචන එල්ල වී ඇත. ඇතැම් විට ඒ පිළිබඳ ධනාත්මක අදහස් ද වේ. නමුත් චිත්‍රපටය මෙන් ම ඊට පාදක වූ මිනර්වා නාට්‍ය ද අතිශය ජනප්‍රියත්වයට පත් නිර්මාණ විය. එබැවින් කඩවුණු පොරොන්දුව චිත්‍රපටයෙන් නිරූපිත සමකාලීන සමාජ සංලක්ෂණය කවරාකාර ද යන්න අධ්‍යයනයේ ගැටලුව වේ. නාමාවලියේ චිත්‍රපටයේ තිර කතාව බී.ඒ.ඩබ්. ජයමාන්න සහ  ජේ.සිංහ ලෙස සඳහන් වුව ද කතාව දෙබස් දර්ශන පෙළගැස්වීම ආදිය බී.ඒ.ඩබ්. ජයමාන්නගේ නාට්‍ය අනුව ම සිදු කෙරී ඇත. මිනර්වා නාට්‍යයේ චරිත නිරූපණය කළ පාත්‍ර වර්ගයා ම චිත්‍රපටයේ ද එකී චරිත නිරූපණයේ යෙදී ඇත. නාට්‍යයේ තිරරචක හා අධ්‍යක්ෂ වන ජයමාන්න ඉපදුනේ ද, අධ්‍යාපනය ලැබුවේ ද, දිවි ගෙවූයේ ද මීගමුව ප්‍රදේශයේ ය. එනම් කතෝලික ආගමික පරිසරයක් සහිත සමාජ පසුබිමක ය. චිත්‍රපටයේ අධ්‍යක්ෂ ජේ. සිංහ දකුණු ඉන්දියානුවෙකු වූ බැවින් සහ නළුනිළි පිරිසට චිත්‍රපට මාධ්‍ය පිළිබඳ තිබූ අනවබෝධය හේතුවෙන් සහ චිත්‍රපටයට පදනම්වූ මිනර්වා නාට්‍යය තාත්විකත්වයෙන් දුරස් වූ තරමක ශෛලිගත රංග වින්‍යාසයක් සහිත බැවින් චිත්‍රපටය තරමක් තාත්විකත්වයෙන් බැහැර වී ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය. මේ ආදී හේතු නිසාත් දේශීයත්වය ජාතිකත්වය පිළිබඳ අදහස් රෝපණය වෙමින් පැවති, එසේම අවශේෂ කලා නිර්මාණ තුළ එකී ලක්ෂණ විශද වෙමින් පැවතුනු යුගයක කඩවුණු පොරොන්දුව චිත්‍රපටය බොහෝ විචාරකදෝෂ දර්ශනයට ලක් වී ඇත. නමුත් චිත්‍රපටය පිළිබඳ වූ විචාර තුළත්, එයින් නිරූපිත සමාජ ඓතිහාසික පැතිකඩ පිළිබඳ ධනාත්මක තොරතුරු ද අනාවරණය කරගැනීමට හැකි විය. චිත්‍රපටයේ නිරූපිත චරිත මගින් ද එකී සමාජ ඓතිහාසික පැතිකඩ නිරූපණය වන  අතර, ඉහළ ධනපති සමාජය, මධ්‍යම පාන්තික සමාජය, පහළ සමාජ ස්තරය ආදී වශයෙන් සමකාලීන සමාජය ස්තර තුනකින් නිරූපණය වේ. එකී විචාරක මෙන් ම චිත්‍රපටය පිළිබඳ සාහිත්‍ය මූලාශය චිත්‍රපටයේ එන සිද්ධි හා අවස්ථා මෙන් ම චරිත සමග සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමෙන් එයින් නිරූපිත සමාජ සංලක්ෂණය පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනීමට හැකි විය. ඒ අනුව කඩවුණු පොරොන්දුව චිත්‍රපටයෙන් සමකාලීන සමාජ පැතිකඩක් නිරූපනය වන බවත්, සමකාලීන සමාජය පිළිබඳ සමාජ විද්‍යාත්මක කරුණු එනම් සමාජ ස්තර තත්වයන් කාර්ය කොටස් ආදිය නිරූපණය වන බවත් අධ්‍යයනයට ලක් කරන ලදී.

**ප්‍රමුඛපදඃ** සමාජ ස්තර; පොදු චරිත ; සමාජ ඓතිහාසික පැතිකඩ; මිනර්වා නාට්‍ය.